**නුවරඑළිය මහා නගර සභාව - 2020**
**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**-------------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය
**-------------------------------**

නුවරඑළිය මහා නගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට නුවරඑළිය මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
**--------------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
**-----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂයපථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂයපථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.6.1 (අ) ඡේදයේ නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ වාර්තාවෙන් පෙන්වාදුන් 1.2.2 (ආ), (ඇ) දරණ ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | හෙළිදරව් කිරීම් වශයෙන් ඉදිරි මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කිරීමට කටයුතු කරමි, සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ අනුව කටයුතු කරමි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙම වැරදි හඳුනාගෙන නිවැරදි කළ යුතු වීම. |
| (ආ) | ජ'නල් සටහන් 22 මඟින් ඉකුත් වර්ෂය සඳහා ලැබිය යුතු ආයෝජන පොළිය ලෙස රු.944,563 ක් ලැබිය යුතු ආයෝජන පොලි ගිණුමට බැර තිබුණද, ලෙජර් ගිණුම තුළ එම වටිනාකම නිරීක්ෂණය නොවූයෙන් ගිණුම තුලනය වූ ආකාරය විගණනයට පැහැදිලි නොවුණි. | ලෙජරය ජර්නල් අංක සටහන් කිරීමේ දී සිදුවූ අත්වැරදීමක් හේතුවෙන් ගිණුම තුලනය වූ ආකාරයේ අපැහැදිලිතාවයක් මතුව ඇත. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙම වැරදි නිවැරදි කළයුතු වීම. |
| (ඇ) | අවස්ථා 07 කදී එකතුව රු.8,128,426 ක් ගිණුම්වලින් අත්හැරී තිබූ අතර අවස්ථා 3 කදී එකතුව රු.23,953,355 ක් වැඩියෙන්ද අවස්ථා 2 කදී එකතුව රු.25,850 ක් ගිණුම්වල අඩුවෙන්ද දක්වා තිබුණි. | නිරීක්ෂණ සම්බන්ධයෙන් එකඟතාවය පළ කරමි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙම වැරදි නිවැරදි කළ යුතු වීම. |
| (ඈ) | මහා නගර සභාව වෙත පරිත්‍යාග ලෙස 1980 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ලැබී තිබුණු මෝටර් වාහන 17 ක් සමාලෝචිත වර්ෂය දක්වාම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | නිරීක්ෂණ සම්බන්ධයෙන් එකඟතාවය පළ කරමි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළයුතු වීම. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 4 කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය හා උපලේඛන වාර්තා අනුව ශේෂය අතර රු.1,301,560 ක වෙනසක් විය. | වාර්තාවේ ඡේදයන් සමඟ එකඟ වෙමි. | වෙනස්කම් සසඳා ගිණුම්වල අවශ්‍ය නිවැරදි කිරීම් කළ යුතු වේ. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ගිණුම් විෂයක් 4 කට අදාළ එකතුව රු.45,392,761 ක් වවුචර්පත්, තහවුරු ලේඛන, උපලේඛන හා අදාළ ලිපිගොනු නොමැතිවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය/ සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය | අදාළ විස්තර, ලිපිගොනු තහවුරු ලේඛන ඉදිරියේදී විගණනයට ඉදිරිපත් කිරීමටත්, ඉදිරියේදී ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කිරීමට ගබඩා භාර කළමනාකරණ සේවා නිලධාරීට දන්වා ඇත. | විගණනයට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලටවලට අනුකූල නොවීම්.

නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති , රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | පාර්ලිමේන්තු පනත් | | | |
| I. | මහා නගර සභා ආඥා පනතේ, 187 වගන්තිය | පෞද්ගලික වාණිජ බැංකුවක ස්ථාවර තැන්පතුවල රු.6,254,301 ක් ආයෝජනය කර තිබුණි. | ගනුදෙනුව සම්බන්ධ අනුමැතින් ඉදිරියේදී විගණනයට ඉදිරිපත් කරමි. | පනත ප්‍රකාරව කටයුතු කළයුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය<br>----------------------- | | | |
| i. | XIX වැනි පරිච්ඡේදයේ | | | |
| • | 6.1 වගන්තිය | යම්කිසි තනතුරකට වෙන්කරන ලද නිවාසයක් හැර අනෙක් සියළුම නිවාසවල බදු කාලය වසර 05 ක් වුවද එම නියමයන් නොසලකා උපලේඛන ගත නොවන නිවාස 12 ක් වසර 08 සිට වසර 28 දක්වා කාලයක් සඳහා නිලධාරීන් වෙත ලබාදී තිබුණි. | අදාළ නිලධාරින් 2020 මාර්තු 02 දින ලිඛිතව දැනුවත් කර ඇත. | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළයුතු වේ. |
| • | 6.14 හා 7.1 වගන්ති | නිලධාරීන් තිදෙනෙකු සභාවෙන් ස්ථාන මාරු වී ගොස් ඇතත් නිවාස ආපසු භාරදී නොතිබුණි. | දැනට ස්ථාන මාරු ලැබූ නිලධාරීන් නිළ නිවාස භාරදීමට නියමිතය. | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළයුතු වේ. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>--------------------- | | | |
| I. | මුදල් රෙගුලාසි 371 | | | |
| a. | (2) (ආ) වගන්තිය | අවු:02 ½ සිට අවු: 07 දක්වා කාල පරාසයක් ගතවී තිබුණු නගර සභා නිලධාරීන් වෙත ලබා දී තිබූ නොපියවූ අත්තිකාරම් ශේෂ 12 ක් පැවතුණි. 2021 ඔක්තෝබර් 31 දින වනවිටත් එයින් පියවා තිබුණේ රු.170,000 ක අත්තිකාරම් ශේෂ 03 ක් පමණි. | අත්තිකාරම් පියවීම වෙනුවෙන් අදාළ පාර්ශවයන් දැනුවත් කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. |
| b. | 05 වගන්තිය | රාජ්‍ය ආයතනයකට ලබාදුන් රු.1,525,000 ක අත්තිකාරම් මුදල් 2021 ඔක්තෝබර් 31 වන විටත් පියවා නොතිබුණි. | භාණ්ඩ ලැබී නොමැති බැවින් අත්තිකාරම් පියවා නොමැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| II. | මුදල් රෙගුලාසි 571(2) | වසර 02 ඉක්ම වූ රු.3,708,441 ක් වටිනා තැන්පතු ශේෂ 92 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මහා නගර සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.125,474,515 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 134,594,992 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු | | |
| (i) | සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් බදු හිඟය රු.77,163,577 ක් විය. එම වර්ෂයේ බිල් කිරීම වූ රු.63,357,784 ට සාපේක්ෂව සියයට 122 ක් වැනි ඉහළ අගයක පැවතුණි. වර්ෂයේ බිල් කිරීම්වලින් රැස්කළ ආදායම රු.31,023,637ක් හෙවත් සියයට 49 ක් විය. වර්ෂය ආරම්භයේ හිඟ වරිපනම් රු.60,816,292 වූ අතර ඉන් වර්ෂය තුළ අයකිරීම් රු.11,547,857 ක් වීමෙන් රු.49,268,435 ක හිඟයක් වසර 01 සිට වසර 30 දක්වා කාල පරාසයක සිට පැවතුණෙන් ආදායම් රැස්කිරීමේ නිළධාරීන්ගේ සේවය අකාර්යක්ෂම විය. | අදාළ වාර්තා සකස් කර මුදල් කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස ආදායම් පරීක්ෂකට දන්වා ඇති බවත්, 2022 වර්ෂයේදී රතු නිවේදන යැවීමට අපේක්ෂා කරන බවත් දන්වා ඇත. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළයුතු වීම. |
| (ii) | 2020 දෙසැම්බර් 31 දිනට හිඟ ජල ගාස්තුව රු.24,849,801 ක් වූ අතර වසර 5 කට වඩා ජල බිල්පත් හිඟ හිටවූ පාරිභෝගිකයින් 119 දෙනෙකුගෙන් අයවිය යුතු මුදල රු.2,574,782 ක් විය. ජල පාරිභෝගිකයන් 1303 දෙනෙකුගෙන් වසර 1 සිට 5 දක්වා අයවිය යුතු මුදල රු.9,468,385 ක් විය. | ඉදිරියේදී ජල විසන්ධි කිරීම සඳහා ක්‍රියාත්මක සැලැස්මක් සකස් කර ඇත. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | කුලී | | |
| (i) | 2020 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.32,213,164 ක කඩ කුලියෙන් සියයට 41 ක් හෙවත් රු. 13,304,026 ක් වසර 5 සිට වසර 30 දක්වා දීර්ඝ කාලයක සිට කඩ හිමියන් 139 දෙනෙකුගෙන් අයවිය යුතුව පැවතුණි. | 2021 අගෝස්තු 25 දින වාස බද්ද අවසන් කිරීමේ නිවේදන නිකුත් කර ගාස්තු ගෙවන ලෙස දන්වා ඇත. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළයුතු වේ. |
| (ii) | ජේම්ස් වීදියේ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය ඉටු කිරීමේදී 2004 වර්ෂයේදී කඩා ඉවත් කළ නිවාස 05 ක් වෙනුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට රු.1,957,000 ක ගෙවල් කුලී හිඟයක් පැවතුණි. | සභා තීරණයන්ට අනුව කමිටු නිර්දේශ ලබා ගැනීමට ඉදිරි කටයුතු කරමින් පවතී. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළයුතු වේ. |

| | | | |
| --- | --- | --- | --- |
| (iii) | 2020 දෙසැම්බර් 31 දිනට ටෙන්ඩර් මත බදු දීම්වලින් ලැබිය යුතු මුදල රු.13,386,469 ක් විය. ඉන් රු.2,650,659 ක් වසර 1 ත් 5 ත් අතර කාල පරාසයක සිට අයවිය යුතුව පැවති අතර වසර 5 කට වැඩි හිඟය රු.1,784,026 ක් විය. | වාර්තා සකස් කර මුදල් කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස ආදායම් පරීක්ෂකට දන්වා ඇත. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළයුතු වේ. |
| (ඇ) | බලපත්‍ර ගාස්තු<br>----------------- | | |
| | 558 ක් වූ වාර්ෂික බලපත්‍ර සඳහා සමාලෝචිත වර්ෂයේ බිල් කිරීම් රු.5,029,947 ක් වුවද, ඉන් රු.329,740 ක් පමණක් අයවී තිබුණි. වාර්ෂික ඉඩම් බලපත්‍රවලින් 2019 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂය රු.11,303,115 ක් වූ අතර එය 2020 දෙසැම්බර් 31 දින වන විට රු.15,165,412 ක් දක්වා සියයට 34 කින් වර්ධනය වී තිබුණි. | ඉඩමේ වර්තමාන තත්ත්වය සහ අයිතිය තහවුරු කර ගැනීම සඳහා සියළුම ලිපිගොනු සමූහ ක්ෂේත්‍ර පරීක්ෂණයට යොමු කළ යුතු වේ. | නොපමාව ආදායම් රැස් කිරීමට කටයුතු කළයුතු වේ. |
| (ඈ) | උසාවි දඩ හා මුද්දර ගාස්තු<br>------------------------------- | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2020 දෙසැම්බර් 31 ට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.459,142 ක් හා මුද්දර ගාස්තු රු. 31,089,108 ක් විය. | පිළිතුරු ලබාදී නැත. | නොපමාව ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඉ) | වෙනත් ආදායම්<br>------------------- | | |
| (i) | ග්‍රෙගරි වැවේ බෝට්ටු සේවය ආරම්භයේ සිට 2021 අප්‍රේල් 30 වන දින දක්වා කාලය තුළ බෝට්ටු හිමියන් 40 දෙනෙකුගෙන්, රු.15,987,248 ක මුදලක් අයවීමට තිබුණි. ඒ තුළ වසර 03 ට වැඩි හිඟ ශේෂ රු.9,734,854 ක් හා වසර 1 ත් 3 ත් අතර හිඟහිටි ශේෂය රු.4,509,813 ක් විය. | හිඟ මුදල් ගෙවා නිම කරන තෙක් බෝට්ටු ධාවනය නවතා ඇත. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළයුතු වේ. |
| (ii) | ග්‍රෙගරි වැවේ හෙලිකොප්ටර් ගොඩ බැස්සවීම සඳහා රජය අනුමත බදු මුදල් සමඟ රු.5,000 ක් සහ අලෙවිකරනු ලබන ප්‍රවේශ පත්‍ර වටිනාකමින් සියයට 10 ක විනෝද බදු මුදලක් මහා නගර සභා අරමුදලේ තැන්පත් කළ යුතු වුවත්, ගැසට් පත්‍රයේ විධිවිධාන පරිදි ටිකට් පත් අලෙවි කිරීමට පෙර මහා නගර සභාව වෙත ඉදිරිපත් කර සියයට 10 ක වටිනාකම තැන්පත් කර නොතිබුණි. හෙලිකොප්ටර් ගොඩ බස්සවන කාලය තුළ නිකුත් කරනු ලබන ප්‍රවේශ පත්‍ර ගණන සම්බන්ධයෙන් දිනපතා පරීක්ෂාවක්ද සිදුකර නොතිබුණි. | ආදායම් පරීක්ෂක නිලධාරීන් හා ප්‍රවේශ පත්‍ර පාලිකාවන් මාර්ගයෙන් සිදුකරගෙන යනු ලබයි. එහි ප්‍රගතිය ඉදිරියේදී විගණනය වෙත දැනුම් දීමට කටයුතු කරමි. | දිනපතා පරීක්ෂාවක් සිදු කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රධාන තක්සේරුකරුගේ 2003 පෙබරවාරි 27 දිනැති තක්සේරුව හා මධ්‍යම පළාත් තක්සේරුකරුගේ 2019 අගෝස්තු 21 දිනැති කඩකුලී තක්සේරුව සම්බන්ධයෙන් කඩකුලී හිමියන්ගේ හා නාගරික මන්ත්‍රීවරුන්ගේ විරෝධතා හේතුවෙන් නව තක්සේරු කුලිය අය නොකිරීම නිසා 2003 වර්ෂයේ සිට මහා නගර සභාවට මේ දක්වා අහිමි වී ඇති සමස්ත ආදායම රු.254,786,700 ක් විය. | මතුවූ විරෝධතා හේතුවෙන් මෙසේ සිදු වී ඇත. | සභා අරමුදලට පාඩුවක් නොවන සේ තීරණ ගත යුතු වේ. |
| (ආ) | මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව 2020 දෙසැම්බර් 31 දිනට සිදුකළ භාණ්ඩ සමීක්ෂණය අනුව පොදු ගබඩාවේ අයිතම 103 ක ඒකක 15793 ක ඌනතා පැවතුණි. ගබඩා ඌනතාවල මුහුණත වටිනාකම රු.1,644,240 ක් වූ විවිධ පොදු මුදල් කුවිතාන්සි පොත්, ටිකට් පොත් අස්ථානගතවීම් අවස්ථා 33 ක් පැවතුණි. | මුදල් රෙගුලාසි 104 පරීක්ෂණයක් පවත්වා අයකර ගැනීමට මුදලක් ඇත්නම් මුදල රෙගුලාසි 105 අනුව කටයුතු කරමි. | තොග ඌණතා සම්බන්ධයෙන් වගකිව යුතු නිළධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහා නගර සභාවේ ණයහිමි ලේඛන නඩත්තුව හා පවත්වාගෙන යාම ඉතාමත් දුර්වල මට්ටමක පැවතීම හේතුවෙන් නිවැරදි ණයහිමි ශේෂය හඳුනාගැනීමට නොහැකි විය. ඉදිරිපත් කර තිබුණු පොදු සැපයුම් ණය හිමි උපලේඛනය අනුව 2017 සිට 2019 දක්වා පොදු සැපයුම් ණයහිමියන් 150 කට අදාළ එකතුව රු.2,124,902 ක් වූ ශේෂය වසර 01 සිට වසර 03 ක කාල පරාසයක් ගත වී තිබුණද හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | උපලේඛනය ඉදිරිපත් කිරීමේ දී වැරදි උප ලේඛනයක් ඇතුළත් වී ඇති අතර එමඟින් ගිණුමේ සංශෝධනයක් නොවන බව කාරුණිකව සඳහන් කරමි. | නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය . |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 03 ක් ඉක්මවා තිබු නොපියවූ අත්තිකාරම් ශේෂය රු.1,359,500 ක් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අත්තිකාරම් පියවීම වෙනුවෙන් අදාළ පාර්ශවයන් දැනුවත් කිරීම සිදු කරමි. | නොපමාව නිරවුල් කිරීමට පියවරගත යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රාජ්‍ය අංශ ගිණුම් 29 ක හා පෞද්ගලික ගිණුම් 431 ක පැවති, ගෙවිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු.74,596,266 ක් වූ අතර ඒ තුළ වසරක් ඉක්මවූ රු.16,663,205 ක පළාත් විශ්‍රාම වැටුප දායක මුදල් ගිණුමේ ශේෂය හා පෞද්ගලික ගිණුම් 155 ක රු.4,430,793 ක් වූ ශේෂ 156 ක් පැවතුණි. 2021 ඔක්තෝබර් 31 දිනට මෙයින් රාජ්‍ය අංශ ගිණුම් 28 ක හා පෞද්ගලික අංශ ගිණුම් 242 ක ශේෂ රු.35,179,767 ක් නිරවුල් වී පැවති අතර තවදුරටත් රාජ්‍ය අංශ ගිණුමක රු.16,899,043 ක් ශේෂයක්ද, පෞද්ගලික අංශ ගිණුම් 188 ක රු.22,217,458 ක ශේෂයන්ද ගෙවිය යුතුව පැවතුණි. | නිරවුල් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වා ඇත. | නිරවුල් කිරීමට නොපමාව කටයුතු කළ යුතුය. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය අනුව, තක්සේරු කුලිය යටත් පිරිසෙයින් වසර 05 කට වරක් සංශෝධනය කළ යුතු වුවද, සභාව සතු කඩ කාමර 463 ක් සඳහා අවසාන වරට 2009 වර්ෂයේ කළ තක්සේරුව 2020 වර්ෂය වන විටද ක්‍රියාත්මක කර නොතිබුණි. | මතු වූ විරෝධතා හේතුවෙන් ක්‍රියාත්මක නොකරන ලදී. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | මහා නගර සභාව සහ කඩ හිමියන් අතර අත්සන් කරන ලද ගිවිසුමේ II (2) එකඟතාවය අනුව කඩ කාමර අතුරු බදුදිය නොහැකි වුවද, කඩ කාමර 90 ක් අතුරු බදු දී තිබූ බව තහවුරු වී තිබුණි. පළාත් පාලන කොමසාරිස්ගේ 2016 අගෝස්තු 15 දිනැති අංක 2016/03 දරන චක්‍රලේඛය අනුව කඩ අතුරු බදු දී ඇති අවස්ථාවක මාස 120 ක කුලිය ලබා ගනිමින් අතුරු බදුකරු වෙත අයිතිය පවරා දීමට අවසර ලබාදී තිබුණද අතුරු බදු දී තිබූ කිසිදු කඩයක අයිතිය මාරු කිරීමට 2021 අප්‍රේල් 28 දින දක්වාම කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් පරිදි ක්‍රියා කිරීමට කටයුතු කරමි. | අතුරු බදුකරු වෙත අයිතිය පවරා දීමට කටයුතු කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වික්ටෝරියා උද්‍යානයේ නව ආපන ශාලාව පවත්වාගෙන යාම වාර්ෂිකව සියයට 10 ක වැඩිවීමක් මත 2011 මාර්තු 15 දින සිට වසර 10 කට බදුදීමට 2011 පෙබරවාරි මස පැවති මහා සභාවකදී තීරණය කර තිබූ අතර එම තීරණ මත මෙම ආපන ශාලාව වාර්ෂිකව විවෘත ප්‍රසම්පාදන ක්‍රමවේදයකට යොමුවීම පසුගිය වසර 10 තුළම සිදු කර නොතිබුණි. එසේම මෙම බදුකරු 2017 වර්ෂයේ සිට රු.2,241,319 ක හිඟ හිටවා තිබුණද සභාව විසින් මෙම බදුකරුට එරෙහිව කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අදාළ හිඟ මුදල් අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත. | නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කළ යුතු වේ. |
| (ඈ) | හාවාඑළිය උඩුපුස්සැල්ලාව පාරේ පිහිටි අක්කර 06 යි පර්චස් 35.2 ක් වූ ඉඩම ඇඟලුම් කම්හලක් පවත්වාගෙන යාම සඳහා පුද්ගලික සමාගමක් වෙත 1982 අගෝස්තු 01 දින සිටද, එයටම යාබදව පිහිටි රූඩ් 02 යි පර්චස් 34.8 ක් වූ ඉඩම කෘතිම ඇහි පිහාටු නිෂ්පාදනය කිරීමේ කම්හලක් පවත්වාගෙන යාම සඳහා වෙනත් පුද්ගලික සමාගමක් වෙත 1984 මාර්තු 24 දින සිටද බදු දී තිබුණි. එක හා සමාන පහසුකම්වලින් යුතු එකිනෙකට යාබදව පිහිටි සමාන කටයුතුවල යෙදෙන කර්මාන්ත ශාලා පවත්වාගෙන යන ඉඩම් කැබලි දෙකක් වෙනුවෙන් එක බිම් කැබැල්ලකට පර්චසයට රු.21,637 බැගින් වූ බදු මුදලක්ද අනෙක් ඉඩම වෙනුවෙන් පර්චසයකට රු.1,788 ක් වූ බදු මුදලක්ද නියම කිරීම හේතුවෙන් ආදායම් අයකර ගැනීමේදි සියළු පාර්ශවයන්ට සාධාරණයක් ඉටුවන පරිදි සමාන පදනමක් මත කටයුතු කර නොතිබුණි. | මහා සභා තීරණයක් අනුව කමිටුවක් පත් කර ඇති අතර එහි තීරණ මත ඉදිරි කටයුතු කරමි. | සැමට සමාන පදනමකින් කටයුතු කළ යුතු අතර අදායම් අහිමි වීම සම්බන්ධයෙන් වගකිව යුතු නිළධාරීන්ගෙන් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ හෙළ බොජුන්හලක් ඉදි කිරීම සඳහා වික්ටෝරියා උද්‍යානය ආසන්නයේ පිහිටි පර්චස් 21.55 ක බිම් කොටසක් 2016 වර්ෂයේදී බදු දී තිබුණද, බදුකරු සමඟ විධිමත් බදු ගිවිසුමකට එළඹ නොතිබීම හේතුවෙන් කිසිදු බදු කුලියක් මේ දක්වා අයකර ගැනීමට නොහැකිව තිබුණි. | ගිවිසුමේ සංශෝධනයන් තවමත් සිදු වේ. | ගිවිසුමක් අත්සන් කිරීමට කටයුතු කළ යුතු අතර මෙයට වගකිව යුතු නිළධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඊ) | අක්කරයක පමණ වපසරියකින් යුතු බඹරකැළේ ගල් වල ඉඩම හා 2008 දෙසැම්බර් 24 දින වර්ෂයකට රු.26,500ක මුදලකට ව්‍යාපාරිකයෙක් වෙත බදු දී තිබුණි. බදු ගිවිසුමේ දෙවන උප වගන්තිය අනුව ගිවිසුම් කාලය 2012 දෙසැම්බර් 24 දිනෙන් අවසන් වුවද ඉඩම සහ ගල්වල 2020 අවසන් වනවිටද පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලිපි ගොනු අල්ලස් හා දූෂණ විමර්ෂණ කොමිසම වෙත රැගෙන ගොස් පරීක්ෂණයක් පැවැත්වේ. | සභා අරමුදලට පාඩුවක් නොවන සේ තීරණ ගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (උ) | රාජ සන්තක ඉඩම් පිළිබඳ ආඥා පනතේ 217 වගන්තිය අනුව පදිංචිය සඳහා ඉඩම් බදු දීමේදි ඉඩමේ නොදියුණු වටිනාකමින් සියයට 4 ක වාර්ෂික බද්දක් අයකළ හැකි වුවද එසේ අය කිරීම් සිදු නොකර 2017 අගෝස්තු 25 දිනැති කොමසාරිස්වරයාගේ තීරණය අනුව, ඉඩමේ පිහිටීම මත නිරීක්ෂණය කළ වටිනාකමක් අය කරගෙන පැවතුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. නමුත් පර්චස් 10 ට අඩු ඉඩම් සඳහා ග්‍රාම නිලධාරී තක්සේරුවත් පර්චස් 10 ට වැඩි ඉඩම් සඳහා ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුවත් යොදා ගැනීමට මුදල් කාරක සභාව නිර්දේශ කර ඇත. | සභා අරමුදලට පාඩුවක් නොවන සේ තීරණ ගත යුතු වේ. |

### 3.4 මතභේදයට තුඩුදෙන කරුණු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහා නගර සභා ආඥා පනතේ 252 වගන්තිය අනුව දේපළ තහනමට ගන්නා බව දැන්වීමේ ලිපි අත්සන් කර තිබුණද, එම ලිපි අදාළ පුද්ගලයින් වෙත භාර නොදුන් අවස්ථා 14 ක් පැවතුණි. | දේපල අයිතිකරුවන් විසින් එම දේපලෙහි නම මාරු කර ගැනීම සඳහා අදාළ ලේඛන ඉදිරිපත් කර නොමැත. | දේපළ තහනමට ගන්නා බව දැන්වීමේ ලිපි අදාළ පුද්ගලයන් වෙත නොපමාව ලබා දිය යුතුවේ. |
| (ආ) | හිඟ ආදායම් අයකර ගැනීම සඳහා වාර්ෂිකව නාගරික කොමසාරිස් විසින් වාස බද්ද අවසන් කිරීමේ නිවේදන අත්සන් කර ආදායම් පරීක්ෂකවරයාට ලබාදී තිබුණද ඔවුන් විසින් එම නිවේදන අදාළ කඩහිමියන් වෙත ලබාදී නොතිබුණු අවස්ථා 94 ක් පැවතුණි. | ව්‍යාජ ලෙස බිල්වන කඩ සඳහා වූ නිවේදන වේ. | වාස බද්ද අවසන් කිරීමේ නිවේදන අදාළ පුද්ගලයන් වෙත නොපමාව ලබා දියයුතු වේ. |

### 3.5 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නුවරඑළිය ග්‍රෑන්ඩ් හෝටලය පාර පිහිටි රූඩ් 01 යි පර්චස් 31.4 කින් යුතු බිම් කොටස 1979 සැප්තැම්බර් 01 සිට වසරක කාලයක් සඳහා පුද්ගලයෙකු වෙත බදුදී තිබුණි. බදු කාලය ඉකුත් වීමෙන් පසු ගිවිසුම අළුත්කර නොතිබුණු අතර, 2012 දක්වා වාර්ෂිකව රු.6,000 ක බදු මුදලක් අය කරමින් බදු ඉඩමේ වපසරියට වැඩි භූමි ප්‍රමාණයක් බදුකරු අනවසරයෙන් භුක්ති විඳ තිබුණද, මහා නගර සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව වැඩදායි ව්‍යාපෘතියක් සිදු කිරීමට කටයුතු කරමි. | නොපමාව අත්පත් කර ගැනීමට පියවර ගත යුතු වේ. |

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ආ) | 2020 ඔක්තෝබර් 19 දින සිදුකරන ලද නියැදි පරීක්ෂාවේදී, ග්‍රෑන්ඩ් හෝටලය පාර හිල් ක්ලබ් ඉදිරිපස අංක 10 දරන ඉඩම වටා මහා නගර සභාව විසින් ආරක්ෂිත වැටක් ඉදිකර ආරක්ෂක නිලධාරියෙකු යොදවා තිබුණද, ඉඩම අනවසරයෙන් වගාකර එහි තාවකාලික නිවසක පවුලක් පදිංචි වී තිබුණි. | සන්තකය පවරා ගැනීමට නීතිමය කටයුතු කරමි. | නොපමාව අත්පත් කර ගැනීමට පියවර ගත යුතු වේ. |

**3.6 ව්‍යාපෘති, කර්තව්‍යයන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුංචි එංගලන්තය නමින් හඳුන්වනු ලබන නගරය වඩාත් ආකර්ෂණීය හා වාණිජ මෙන්ම සංචාරක නගරයක් කිරීමේ අභිලාශයෙන් නිවාස හා වාණිජ ගොඩනැගිලි 03 ක්, රථ ගාලකින් සමන්විත මහල් 07 කින් යුතු ඉදිකිරීම් 03 ක් සිදුකිරීම සඳහා 2016 ජූනි 29 වන දින මහා නගර සභාව හා රජයේ සතු කොටස්වලින්ද සමන්විත පුද්ගලික සමාගමක් සමඟ වසර 03 ක් ඇතුළත නිම කිරීමට ගිවිසුම්ගතව තිබුණි. සමාගමේ මුදල් යොදවා කර්මාන්තය නිමකර එහි විකුණුම් වටිනාකම් මඟින් අදාළ වියදම් ආවරණය කර ගැනීමටත් සභාවට සභා කාර්යාලය, පොළ භූමිය හා රථගාල ලබාදීමටත් ගිවිසුම තුළින් එකඟ වී තිබුණි. ඒ අනුව 2018 මැයි 15 දින වන විට උක්ත සමාගම විසින් මූලික කටයුතු සඳහා රු.10,954,477 ක මුදලක් වැයකර තිබූ අතර 2018 මැයි 15 දින සභාව විසින් ගිවිසුම අවලංගු කිරීමටත් එම ආයතනය හෝ නව ආයෝජකයෙකු සම්බන්ධකර ගනිමින් සභාවට ඉහළ ප්‍රතිලාභ අත්වන පරිදි නව ගිවිසුමකට එළඹීමටත් තීරණයක් ගෙන තිබුණි. ගිවිසුම අවලංගු කර වසර 03 ක් ගතවුවත් මෙම ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමේ කටයුතුවල ප්‍රමාණවත් ප්‍රගතියක් 2021 මැයි මස දක්වාත් නොමැති බව නිරීක්ෂණය විය. | ඉදිරියේදී ඉඩම් කොටස් පවරාගෙන නැවත ක්‍රියාත්මක කරමි. | නැවත ක්‍රියාත්මක කර අරමුණු ඉටු කරවා ගත යුතු වේ. |

**3.7 ප්‍රසම්පාදන කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගැනීම සඳහා 2019 ඔක්තෝබර් 07 දින පුවත්පත් දැන්වීම් පළකර තිබූ අතර අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2019 ඔක්තෝබර් 31 විය. මෙහිදී ප්‍රමාණවත් සැපයුම්කරුවන් පිරිසක් ලියාපදිංචි නොවීම තුළ මුදල් කාරක සභාව විසින් 2019 නොවැම්බර් 25 දින තෙක් දින දීර්ඝ කර තිබුණද, ඉල්ලුම්පත් සඳහා ආරාධනා කරන සියළු පාර්ශව දැනුවත් කිරීමට පියවරගෙන නොතිබුණි. | නිරීක්ෂණ පිළිගනිමි. 2021 වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමේදී මෙම අඩුපාඩු මගහරවා ගැනීමට කටයුතු කරමි. | ප්‍රසම්පාදන නීති රීති රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 1989 ජනවාරි 20 දිනැති අංක 541/17 දරන පළාත් පාලන අතුරු ව්‍යවස්ථාවේ 3 (අ) 1 අනුව සියළු ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිළ කැඳවීම් කිරීමට කටයුතු කළ යුතු නමුත් රු.6,688,653 ක් වටිනා මිළ කැඳවීම් අවස්ථා 14 කදී ලියාපදිංචි වූ සියළු සැපයුම්කරුවන්ගෙන් මිළ කැඳවීම් සිදුකර නොතිබුණි. | නිරීක්ෂණ පිළිගනිමි. 2021 වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමේදී මෙම අඩුපාඩු මගහරවා ගැනීමට කටයුතු කරමි. | ප්‍රසම්පාදන නීති රීති රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6 මාර්ගෝපදේශය අනුව මුල් කොන්ත්‍රාත්තුව පිරිනැමූ දින සිට සය මසක කාලයක් ඇතුළත නැවත වරක් ආර්ථික වශයෙන් වාසිදායක නොවන විටෙක හා පළමු ඇණවුමෙන් පසුව සාමාන්‍ය මිළ අඩුවීම් නොමැති විටක මුල් කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 50 ක් දක්වා නැවත ඇණවුම් කළ හැකි වේ. නමුත් වැලි කියුබ් 10 ක්, චිප්ස් කියුබ් 20 ක් හා ABC කියුබ් 15 ක්, සිමෙන්ති මිටි 100 ක් මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කැඳවා තිබුණද නැවත ප්‍රසම්පාදන නොකැඳවා සිමෙන්ති මිටි 682 ක් ABC කියුබ් 150 ක් හා වැලි කියුබ් 30 ක් රු.2,470,000 ක මිලදී ගැනීම් ප්‍රසම්පාදන නියමයන්ගෙන් බැහැරව සිදුකර තිබුණි. තවද ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන්ගෙන් රු.50,000 ක සිමෙන්ති මිටි මිලදී ගෙන තිබුණි. | නිරීක්ෂණ පිළිගනිමි. 2021 වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමේදී මෙම අඩුපාඩු මගහරවා ගැනීමට කටයුතු කරමි. | ප්‍රසම්පාදන නීති රීති රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | ටයර් සැපයීම ලියාපදිංචි සැපයුම්කරුවන් 12 ක් සිටියදී යාන්ත්‍රික අංශය සඳහා ටයර් 286 ක් ලබා ගැනීමට ලියාපදිංචි සැපයුම්කරුවන් තිදෙනකුගෙන් පමණක් අතින් මිල ගණන් ලබාගෙන තිබුණි. එහිදී ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන් තිදෙනකුගෙන්ද, විවිධ වර්ගවල ටයර් සඳහා මිල ගණන් ලබාගෙන රු.2,084,396 ක් වටිනා ටයර් මිළදීගෙන තිබුණි. | නිරීක්ෂණ පිළිගනිමි. 2021 වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමේදී මෙම අඩුපාඩු මගහරවා ගැනීමට කටයුතු කරමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ |
| (ඉ) | රු.46,280 සිට රු.1,575,000 දක්වා වූ මිළ පරාසයක හදිසි මිලදී ගැනීම් 106 ක් සඳහා නගරාධිපතිවරයාගේ ආවරණ අනුමැතිය ලබාගෙන තිබුණු අතර නගරාධිපතිවරයාට ආවරණ අනුමැතිය ලබාදිය හැකි උපරිම සීමාව තීරණය කළ සභා වාර්තාවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | නිරීක්ෂණ පිළිගනිමි. 2021 වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමේදී මෙම අඩුපාඩු මගහරවා ගැනීමට කටයුතු කරමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඊ) | ප්‍රජාපාදක සමිතිවලට කොන්ත්‍රාත් පිරිනැමීමේදී රජයේ අපේක්ෂාව අදාළ ප්‍රදේශයේ රැකියා අවස්ථා ජනනය කර | නිරීක්ෂණ පිළිගනිමි. 2021 වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමේදී මෙම අඩුපාඩු | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ |

| | | |
|---|---|---|
| ප්‍රදේශය නගාසිටුවීම වුවද, 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.4 ඡේදයට අනුකූල නොවන ලෙස, රු. මිලියන 3.6 ක් වටිනා නුවරඑළිය ආදර්ශ සාප්පු සංකීර්ණයේ පෙනුම වෙනස් කිරීමේ ව්‍යාපෘතිය රු.මිලියන 1.8 ක් බැගින් වූ කොටස් දෙකකට වෙන් කර ප්‍රජා පාදක සමිති දෙකකට ලබා දී තිබුණි. නමුත් සමිති දෙක මෙම කොන්ත්‍රාත්තුව පෞද්ගලික සමාගමකට උප කොන්ත්‍රාත් ලබා දී තිබුණි. | මඟහරවා ගැනීමට කටයුතු කරමි. | යුතු වේ. |

**3.8 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

-----------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සඳතැන්න දෙවන පටුමග මාර්ගය සංවර්ධනය කිරීම 2019 දෙසැම්බර් 16 දින සිට 2020 මාර්තු 11 දක්වා ඉටුකළද 2020 මාර්තු 11 දින ලබාගත් කොන්ක්‍රීට් සාම්පලයක රසායනාගාර වාර්තා පදනම් කර ගනිමින් රු.3,362,267 ක් ගෙවීම් කර තිබුණි. | මාර්තු 5 සහ 10 දින සාම්පල ලබාගෙන ඇත. | සියළු කර්මාන්ත නොපමාව තත්ත්ව පරීක්ෂණවලට ලක් කළ යුතු වේ. |
| (ආ) | ව්‍යාපෘතිය ආරම්භයේ සිට අවසානය දක්වා දෛනිකව සිදුකරන ලද කාර්යයන් සහ ව්‍යාපෘතිය අධීක්ෂණය කරනු ලබන කාර්මික නිලධාරීන්/ ඉංජිනේරුවරුන් විසින් භෞතික පරීක්ෂා කිරීම්, උපදෙස් ලබාදීම් සම්බන්ධයෙන් ලොග් සටහන් පවත්වාගෙන යා යුතු වුවත් නියැදි පදනම මත පරීක්ෂා කරන ලද ව්‍යාපෘතීන් 06 ක් වෙනුවෙන් ලොග් සටහන් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. | නියමිත පරිදි ලොග් සටහන් පවත්වාගෙන යා යුතු වේ. |

**3.9 මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි උපදෙස් පරිදි ස්ථිර පත්වීම් ප්‍රදානය කළ යුතු වන්නේ එම සේවකයින් සේවයට බඳවාගෙන තිබූ තනතුරුවලට වුවද, කම්කරුවන් ලෙස සේවයකළ 14 දෙනෙකුගෙන් 13 දෙනෙකු රියදුරු තනතුරුවලද, එක් අයෙකු වැද්දුම් තනතුරෙහිද ස්ථිර කර තිබූ බැවින් එම තනතුරු 14 සඳහා 2020 දෙසැම්බර් 31 දිනට ප්‍රතිපූර්ණය කර ගත නොහැකිව තිබූ මුදල රු.8,135,888 ක් විය. | මෙම තනතුරු අනුමත කර ගැනීමට මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත 2020 අගෝස්තු 10 දින ලිඛිතව දන්වා යවා ඇති අතර එම අනුමැතිය ලද පසු ඉදිරි කටයුතු කිරීමට කටයුතු කරමි. | සුදුසු ක්‍රියාමාර්ග නොපමාව ගත යුතු වීම. |

**4.** **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**------------------------------------------**

**පාරිසරික ගැටළු**

**--------------------**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- | --- |
| (අ) | නොදිරන කසළ මිළදී ගැනීමට ටෙන්ඩරය ලබාගත් ටෙන්ඩර්කරු විසින් ප්ලාස්ටික් බෝතල් පමණක් මිලදී ගැනීම නිසා රැස්කර තිබුණු ෆයිබර්, රිජිෆෝම්, ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය, කොළ පාට සහ දුඹුරු පාට වීදුරු බෝතල් කිලෝග්‍රෑම් 12,500 ක් පමණ සන අපද්‍රව්‍ය මධ්‍යස්ථාන භූමියේ ගොඩ ගසා තිබුණි. | කොරෝනා වසංගතයත් සමග නැවත එම ද්‍රව්‍ය එකතු කිරීම ප්‍රමාද වී ඇති බැවින් අදාළ ද්‍රව්‍ය එසේ එකතු වී ඇත. | කසළ කළමනාකරණය නිසි ලෙස ඉටුකළ යුතු වේ. |
| (ආ) | නොදිරන කසළවලින් පොලිතීන් හා ප්ලාස්ටික් අමුද්‍රව්‍ය කැබලිවලට කපා යන්ත්‍ර මඟින් අඹරා අලෙවි කිරීමට සූදානම් කර තිබුණද, ඒ සඳහා ගැනුම්කරුවන් සොයා ගැනීමට මහා නගර සභාව ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණි. | කොරෝනා වසංගතයත් සමග නැවත එම ද්‍රව්‍ය එකතු කිරීම ප්‍රමාද වී ඇති බැවින් අදාළ ද්‍රව්‍ය එසේ එකතු වී ඇත. | කසළ කළමනාකරණය නිසි ලෙස ඉටුකළ යුතු වේ. |
| (ඇ) | අඹරන ලද පොලිතීන් මිළට ගැනීමට ගැණුම්කරුවන් ඉදිරිපත් නොවීම, නිෂ්පාදිත මල් පෝච්චි අලෙවියට ක්‍රමවත් වැඩපිළිවෙලක් නොමැති වීම නිසා 2017 ජූලි වර්ෂයේ සිට කිසිඳු පොලිතීන් වර්ගයක් ඇඹරීම සිදු නොකරන බව අනාවරණය විය. ඒ හේතුවෙන් පොලිතීන් කැබලි කරන යන්ත්‍රය නිශ්කාර්යව පැවතුණි. | ඉදිරියේදී ඒ සඳහා වැඩි ප්‍රචාරයක් ලබාදී ගැනුම්කරුවන් වැඩි කර ගැනීමට කටයුතු කරමි. | කසළ කළමනාකරණය නිසි ලෙස ඉටුකළ යුතු වේ. |